# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 297 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 19/02/2024 පැය1230

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.02.18 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 01 ක් හා එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 30,000/- ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ ගෝනපල හංදිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. ගංජා මිෂ මාවා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර**

2024.02.18 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ යාපනය නගරයේදී වැටලීමක් සිදු කර ගංජා මිශ්‍ර මාවා කිලෝ 05 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් කොකුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්මීමන කඳවුර.

2024.02.18 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අක්මීමන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අක්මීමන පොලිස් වසමේ මුත්තලැහේන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අක්මීමන පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 64 ක් වූ හියාරේ නැගෙනහිර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අක්මීමන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**